සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
**Year End Evaluation**

ශ්‍රේණිය / தரம் / Grade : 10
විෂයය / பாடம் / Subject : සිංහල භාෂාව හා සාහිත්‍යය
පත්‍රය / வினாத்தாள் / **Paper** : පිළිතුරු

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 4 | (11) | 2 | (21) | 1 | (31) | 2 |
| (2) | 2 | (12) | 3 | (22) | 3 | (32) | 1 |
| (3) | 3 | (13) | 2 | (23) | 2 | (33) | 3 |
| (4) | 3 | (14) | 4 | (24) | 2 | (34) | 1 |
| (5) | 1 | (15) | 1 | (25) | 2 | (35) | 4 |
| (6) | 2 | (16) | 2 | (26) | 4 | (36) | 3 |
| (7) | 3 | (17) | 1 | (27) | 2 | (37) | 3 |
| (8) | 3 | (18) | 2 | (28) | 3 | (38) | 1 |
| (9) | 4 | (19) | 4 | (29) | 4 | (39) | 2 |
| (10) | 2 | (20) | 3 | (30) | 4 | (40) | 4 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

(01) (i) (අ) කණ්ඨජ (ආ) මූර්ධජ

(ii) (අ) මහලු (ආ) යතුරු

(iii) (අ) කප/කපන්න/කපනු/කපව/කපනු මැන (ආ) ලිව්වොත් /ලිව්වහොත්

(iv) (අ) ප්‍රගමනය (ආ) පුරෝගාමී

(v) (අ) විශිෂ්ටතම (ආ)නිසැක

(vi) (අ) සාම්ප්‍රදායික (ආ) ප්‍රස්තාව

(vii) (අ) සත්‍ය වචන (ආ) කළගෙඩි දහසයක්

(viii) (අ) එපා වාහෙට හොදි බෙදන්නා වාගේ (ආ) කලක දී වහලු කලකදි රහ වෙනවා ලු

(ix) (අ) නැන්දා (ආ) මාමණ්ඩි

(x) (අ) අපි නීතිගරුක පුරවැසියෝ වෙමු (ආ) ගුරුවරුන් ඇතැම් පාඩම් අත්හරිනු ඇත.

(02) රචනාව සඳහා ලකුණු ප්‍රදානය

- ⋆ සාරවත් භාවය මාතෘකාව ද ඇතුළු ව ලකුණු 8 යි.
- ⋆ සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය ලකුණු 12 යි.
- ⋆ ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදා ලිවීම ලකුණු 5 යි.
- ⋆ මුළු ලකුණු 25 යි.

(03) සාරාංශය සඳහා ලකුණු ප්‍රදානය.

- ⋆ අන්තර්ගතය ලකුණු 06 යි
- ⋆ වචන ප්‍රමාණය ලකුණු 02 යි
- ⋆ ශිල්පීය දක්ෂතා ලකුණු 02 යි
- ⋆ මුළු ලකුණු 10 යි.

අන්තර්ගත විය යුතු අදහස් :

- ⋆ ජාතක පොත , දළදා සිරිත කුරුණෑගල යුගයටත්,
- ⋆ ධර්මකීර්ති හිමියන්ගේ නිකාය සංග්‍රහය, සද්ධර්මාලංකාරය ගම්පොළ යුගයටත්,
- ⋆ උතුරුමුල තෙරුන්ගේ කුවේණි අස්න හා විමලජෝති හිමියන්ගේ සද්ධර්මාකරය කෝට්ටේ යුගයටත් අයත් වේ.
- ⋆ තවත් සන්න පොත් රැසකි.
- ⋆ සාහිත්‍යයේ ස්වර්ණමය යුගය කෝට්ටේ යුගයයි,
- ⋆ සීතාවකත්, මහනුවරත් සාහිත්‍යයේ පරිහානි යුග වේ.

(04) 1. අභිලේඛන අංශයට

2. සීගිරි ගී පිටපත් කර අරුත් පහදා දීම

3. සීගිරි ගී පිටපත් කිරීම

4.සිංහල සාහිත්‍ය වංශයේ හෙළි නො වූ පදාසයක් හෙළිපෙහෙළි වීම.

5. i .නො මැරෙන ii. කොටසක්/පැත්තක් / අංශයක්

(ලකුණු 2 ×5 - 10 යි)

(05) ප්‍රායෝගික ලේඛන

- ⋆ ආකෘතිය ල. 05 යි.
- ⋆අන්තර්ගතය ල. 07 යි.
- ⋆ශිල්පීය දක්ෂතා ල. 03 යි.

මුළු ලකුණු 15 යි

## පිළිතුරු පත්‍රය - III

ප්‍රශ්න අංකය - 01

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 20 යි.

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනුප්‍රශ්නයකට එක කොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20 කි.

(01) (i) (අ) කේවට්ට ආචාරීන්ට /කේවට්ට බමුණාට

(ආ) උම්මග්ග ජාතකය

(ii) (අ) නන් දන කැන් දුටුව ද බිය සිස් වූ
මින් රළවුත් ගං වෙරළට රැස්වූ

(ආ) කෝට්ටේ යුගය

(iii) (අ) සිංහයා

(ආ) ගල් පුවරුව පෙරළීම

(iv) (අ) සීයා විසින් / මහල්ලා විසින් / අතර මගදී හමුවූ මහලු මිනිසකු විසින්.

(ආ) ඒ.පී. ගුණරත්න මහතා ය.

(v) (අ) හමු වුණු කෙණෙහි මා සතු බර ඔහුට දෙමි

(ආ) ගංගාවේ සංගීතය

(vi) (අ) ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි

(ආ) කව්මිණ, කව්මුතු, ළමා කව් කළඹ (ළමා නිර්මාණ එකක් ප්‍රමාණවත්)

(vii) (අ) කඩුල්ලේ තරම දැනගෙන කද බඳිනු
තමන්ගේ තරම දැනගෙන කල් හරිනු

(ආ) ලී කෙළි, ඔළිඳ කෙළි, කළ ගෙඩි නැටුම ,ඔන්චිලි වාරම්, (මින් එකක් සඳහා ලකුණු ලබා දෙන්න)

(viii) (අ) පුංචිරාළ වෙදරාල

(ආ) ලෙනාඩ් වුල්ෆ් මහතා

(ix) (අ) පාලි ජාතකට්ඨ කථාව

(ආ) කාව්‍ය ශේඛරය, ගුත්තිල කාව්‍යය, සඳකිඳුරු දා කව, කුස ජාතක කාව්‍යය, දහම් සොඬ දා කව, වෙස්සන්තර ජාතකය. (මින් එකක් සඳහා ලකුණු ලබා දෙන්න)

(x) (අ) පරමත්ථ ජෝතිකාව

(ආ) අනුරාධපුර යුගය ( ලකුණු 2×10 - 20 )

(02) (i) (අ) දිව්‍ය ස්ත්‍රීන් / දිව්‍ය කාන්තාවන්, විශේෂයෙන්

(ආ) උපමාව :- විදුලිය ලක්ෂ ගණනක් එක විට දිස් වූවාක් මෙන්
උපමේය :- දිව්‍ය කාන්තාවන් ආකාශයෙන් බැස නැටූ ආකාරය.

(ii) (අ) කලබල / විකාර / කෝලම්, ගැවසෙන

(ආ) බැද්දේගම ගම හා එහි වැසියන් ක්‍රමයෙන් අභාවයට පත්වන ආකාරය.

(iii) (අ) නිදහස මහ මුහුදක් වේ.

(ආ) නිදහස මහ මුහුදට සමාන ය. එහි ආරම්භය ඇති වන්නේ පුතුගෙනි. ඒ බව සිහිපත් කර යුතුකම ඉටු කළ යුතු ය.

(iv) (අ) පැළ ඉහළට මතු වී, ඉතා තද කොළපාට,
(ආ) මියුලු නුවර වටා පවුරු මුදුනින් ඉතා නිල්වලා සමූහයක් සේ.

(v) (අ) නොසඟවා ගස් කොළ අතුවලින් තැනූ වස්ත්‍ර
(ආ) පින්වන්ත මගේ අම්මේ, අපි ගස්කොළවලින් තැනූ වස්ත්‍ර හැඳගෙන මේ ගුහාව ඇතුලේ ඉන්නේ ඇයි ද කියා සඟවන්නේ නැතිව කියන්න, වැනි අදහසක්...

( ලකුණු 4 × 5 - 20 )

(03). (i) + (ii) විවිධ විරිත් , උපමා භාවිත වන කවි නිදසුන් වශයෙන් දක්වා විස්තර කර තිබීම අපේක්ෂිතය.

● ඒ සඳහා පහත දැක්වෙන කවි නිදසුන් ලෙස යොදා විස්තරාත්මක ව ඉදිරිපත් කර ඇත්නම් ඉහළ ලකුණක් පිරිනමන්න.

(i) උපමා භාවිතය

- '' සන්සල නොව එහි පිළිරූ ලෙසිනේ ''
- '' සුර සෙනඟට සුරසුන් පැන වූ වැනි ''
- '' සිතිවිලි නැති රූ විලස මුවෝ යා ''
- '' දිසි මෙන් විය විදුලිය සිය දහසී''
- '' රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා ''

(ii) ● වාදය සඳහා පැමිණීමත්, වීනා වාදනය ඇරඹීමත් සඳහා උචිත කෙටි විරිත් යොදා ගැනීම.1 සිට 13 දක්වා කවි.

● වීනා වාදනයේ මිහිරියාව පැතිර යාම. එය ඇසීමට මිනිස් හා සත්ත්වයින් ලොබ බැඳි අයුරු මාත්‍රා හතරෙන් හතරට යතිය සහිත පෙද විරිත යොදා ගැනීම . 14 32 දක්වා කවි.

● සුරඟන රැඟුම් විලාශය දැක්වීම සඳහා විසි අටමත් විරිත යොදා ගැනීම 33-34 කවි.

මීට අමතර ව වෙනත් අදාළ කවි නිදසුන් ලෙස දක්වා විස්තර කර තිබුණොත් නිවැරදි සේ පිළිගන්න.

නැතහොත්,

(i) ● අවුරුදු පනහක් වයසැති කර්ලිනාහාමි පෙනුමෙන් මැහැල්ලකගේ ස්වභාවය ගැනීම

උදා: ''කර්ලිනාහාමිගේ වයස අසූවට වඩා අනූවට කිට්ටු ද කියා හෝ අනූවට වඩා සීයයට කිට්ටු ද කියා හෝ කීම උගහට වී ය.''

● කටුක කැලෑ ජීවිතයේ ලකුණු ඇගේ සිරුරේ ඇඳී තිබීම .

උදා: '' නිරිත දිග තද සුළඟට ඇඹරවී ඇටුවන් බැහී ගිය ගහක් මෙන් ඇගේ ශරීරය ද නැමී ඇඹරී තිබිණ''.

● බඩගින්න, ලෙඩ දුක් නිසා ශරීර ශක්තිය ඉතාම දුර්වල වීම.

උදා : '' කුඹුක් වැනි ගස්වල පිට පොත්ත තැනින් තැන ඉගිලී සුදුව යන්නාක් මෙන් ඇගේ සමේ ද තැනින් තැන දුඹුරුව සුදු පුල්ලි නැගී තිබිණ ''.

(ii) ● වනය ක්‍රමයෙන් දොරකඩට ළං වීම.

උදා: තියුණු කටු ඇති පතොක් පඳුරු ද වැට අද්දරින් රිංගා අවුත් මිදුලටත් ගෙයි බිත්තිවලට හා

දොරකඩටත් ළං විය.

● වහළය ද වනයට ගොදුරු වීම

උදා: ලොකු දළුක් පඳුරක් වහළ මත වැඩී උළු එහා මෙහා කරමින් මුල් ඇදුණේ ය.

● ආරච්චිගේ ගෙය මුළුමනින්ම වනයට ගොදුරුවීම.

උදා: ආරච්චිගේ ගෙය කැලයට යාම කැලය ගම මැදට පැනීමක් මෙන් වී,

මෙවැනි වෙනත් අදාළ නිදසුන් ලබා දී ඇත්නම් ලකුණු ප්‍රදානය කරන්න.

( ලකුණු 15 යි)

ප්‍රශ්න අංක 04

(4) (i) අධිෂ්ඨානශීලී භාවය

⋆කේවට්ටයා හා බ්‍රහ්මදත්ත රජු අතර ඇති වූ සතර කන් මන්ත්‍රණය ගිරා පෝතකයාගෙන් දැන එය මුදුන්පත් කර ගැනීමට ඉඩ නොතැබීමට සිතා ගැනීම.

උදා: කේවට්ටයා මා මහෞෂධ බව නො දනිති 'යි සිතමි. දැන් ඔහු කළ මන්ත්‍රණය මුදුන් පැමිණ නො දෙමි 'යි ..........

⋆විවිධ යුද්ධෝපාය යොදා මියුලු නුවර ජය ගැනීම යුධ සේනාව පලවා හරින ආකාරය කියමින් බියට පත් රජ අස්වසා ලීම.

උදා: මම කැටක් ගෙන කපුටු රැසක් පලවන .............

⋆ධර්ම යුද්ධයෙන් ජය ගැනීමට තරයේ සිතා ගැනීම

උදා: කේවට්ටයා මිනුත් මම පැරැද්දෙමි නම් මාගේ කුමන පණ්ඩිත කමක් ද?

(ii) ස්ථානෝචිත ප්‍රඥාව

⋆යුද උපක්‍රමයක් ලෙස චර පුරුෂයන් යෙදීම.

⋆උපායශීලීව ධර්ම යුද්ධයෙන් ජය ගැනීම.

⋆මියුලු නුවර පවුර අසලටවත් ළං විය නොහැකි වන සේ ආරක්ෂක විධි විධාන යෙදීම

⋆ එක් සියයක් රජ දරුවන් මැරවීමට යෙදූ උපක්‍රමය ව්‍යර්ථ කිරීම.

මේ ආදී කරුණු විස්තර සහිතව ලියා තිබීම අපේක්ෂිත ය. සුදුසු උදාහරණ දක්වා විස්තර කර ඇත්නම් ඉහළ ලකුණක් පිරිනමන්න.

නැතහොත්

(ii) අභියෝග හමුවේ නොබියව මුහුණ දීම

⋆ ''ඉටු කොට කළ යුතු යුතුකම් ......... ''

⋆'' කාටත් හිමි පොදු දේ නම් .......''

⋆'' මිතුරු කමින් පෙර එතොත් ......''

දේශානුරාගී සිතුවිලි ජනිත කිරීම.

⋆ තමන් ලැබූ දිවි පෙවෙතේ .....

⋆ ජාතිය රන් විමනක් වේ.....

⋆ ජාතික රණ දෙරණ මතේ ........

මේ ආකාරයට අදාළ කවි නිදසුන් ලෙස දක්වා විස්තර කර තිබුණොත් ඉහළ ලකුණක් පිරිනමන්න.

(ලකුණු 15 යි)

(5) ⋆ සියලු සම්පත් හැර දමා පැමිණි ස්වාමියා සමඟ ඉතා සතුටින් කල් ගෙවීම.

උදා: මේ සියල්ල හැරදා මම.......

⋆ දරුවන්ට පියා හැර නොයන ලෙස කීම.

පියාගේ ගුණය දරුවන්ට වටහා දීමට උත්සාහ කිරීම

උදා: මෙවන් බස් දොඩනු කිම

ඔබ පියා හැර දමා

⋆ තම ස්වාමියා සමඟ ගෙවූ දිවිය පිළිබඳ සැහීමකට පත් වීම.

උදා: පුරුදු වූ වන වාසේ

මෙහි සැපත නොසැහෙද

⋆දරුවන්ගේ බසට අවනත වී තම ස්වාමියා හැර යාම ගැන ශෝකයට පත් විම හා ඔහුගෙන් සමාව ඇයදීම.

උදා: දෙවියන් බාරයි මා සමිදා......

(ලකුණු 10 යි)

මේ ආදී කරුණු ලියා ඇත්නම් අදාළ පරිදි ලකුණු පිරිනමන්න.

(06) භාෂාව සාර්ථකව යොදා ගැනීම

⋆ සරල භාෂාව

කවි පෙළේ ඕනෑම කවියක් නිදසුන් ලෙස ගන්න.

⋆ ව්‍යංග්‍යාර්ථවත් යෙදුම්

මී අඹ- කිරල- මා දම් ගෙඩි ළදරු වියේ.......

සිරිමල් සිනා රැළි පෙණ පිඬු මිහිරිතම.........

⋆ උත්තම පුරුෂ කථන ක්‍රමය

සැඟවෙමි - එබෙමි - නිසසල වෙමි- සසල වෙමි

⋆ සංකේත රූපී හැඟීම් දනවෙන පද භාවිතය

⋆ ඉඳුනිල් ගැඹුරු දිය

⋆ ලස්සන මල් කැකුළු (ලකුණු 10 යි)

(7) ⋆ පිරුළු ආශ්‍රිත කවි

උදා : ⋆ රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද....

⋆ අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා .....

⋆ ඇස නැති දා පොත ගත්තේ කියන්ට ද

⋆ අර්ථවත් අවස්ථාවෝචිත උපමා යෙදීම

උදා : එක් උන දාට උක් දණ්ඩේ පැණි සේමා

⋆ එකම උපදේශය වඩාත් තහවුරු කර ගැනීමට

පුනරුක්තිය අලංකාර ලෙස යොදා ගැනීම

උදා - ගොඩැල්ලේ තරම දනගෙන ළිඳ කපනු.....

ගසට කෙටුම ගස මුල පැයුමෙන් දනේ.....

මෙවැනි උදාහරණ දෙමින් පිළිතුරු ලියා ඇත්නම් අදාළ ලකුණු ප්‍රදානය කරන්න

(ලකුණු 10 යි)